# මහාවංසය

මහාවංස ලේකම් කාර්යාලය
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

# මහාවංසය හා එහි වැදගත්කම

## *මහාවංසය යනු කුමක් ද?*

වංස කථා, ශ්‍රී ලාංකික සභ්‍යත්වයේ විශේෂ අංගයකි. ථූපවංසය, බෝධිවංසය, ධාතුවංසය වැනි විවිධ බෞද්ධ පූජනීය වස්තූන් අළලා වංස කථා ලියා ඇති අතර එම බෞද්ධ ඉගැන්වීම් අනුව සිය ජීවිත හැඩගස්වා ගත් ජනතාවගේ වසර 3000කට වඩා දීර්ඝ සභ්‍යත්වයේ වර්ධනය අඛණ්ඩව ලියා ඇති කෘතිය මහාවංසය යි. ලෝකයේ වෙනත් කිසිදු රටක දක්නට නො ලැබෙන ආකාරයේ විශිෂ්ට කෘතියක් වන මහාවංසය ශ්‍රී ලාංකික ගිහි-පැවිදිවිද්වතුන්ගේ ශ්‍රේෂ්ඨ ප්‍රයත්නයක ප්‍රතිඵලයකි.

ශ්‍රී ලංකාවේ ශිලා ලේඛන සහ වෙනත් මූලාශ්‍ර කොටස් හරිහැටි අධ්‍යයනය නොකොට මහාවංසය මහාවිහාරික භික්ෂූන් වහන්සේලාගේ ප්‍රලාපයක් ලෙස ප්‍රතික්ෂේප කළ යුගයක් තිබිණි. මහාවංසයේ ඇතුළත් වන්නේ බුද්ධාගම සහ රජවරුන් පිළිබඳ තොරතුරු පමණක් බවට චෝදනාවක්ද විය. එහෙත් විශේෂයෙන් බ්‍රාහ්මී අක්ෂර ලිපි කියවීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ඉතිහාසය පමණක් නොව ඉන්දියානු ඉතිහාසයේ ඇතැම් ගැටලු නිරාකරණය කිරීමට අවශ්‍ය තොරතුරු පවා මහාවංසයේ ඇතුළත්වී ඇති බව සනාථ වී ඇත. මහාවංසයේ ඓතිහාසික අගය පිළිබඳව පෙර අපර දෙදිග බොහෝ පඬිවරුන් කරුණු දක්වා ඇත. ***ජෝර්ජ් ටර්නර්, ජේම්ස් ප්‍රින්සෙප්, හර්මන් ඕල්ඩෙන්බර්ග්, විල්හෙල්ම් ගයිගර්*** වැනි අග්‍රගණ්‍ය බටහිර උගතුන් ඒ අතර ප්‍රධාන වේ.

ඉතා මෑතකදී මහාවංසයේ පළමුවෙනි කොටස පිළිබඳ පරිපූර්ණ අධ්‍යයනයක් කොට එහි සංස්කරණයක් ඉංග්‍රීසියෙන් පළ කළ ශ්‍රී ලාංකික විද්වතෙකු වන ***ආචාර්ය ආනන්ද පී. ගුරුගේ*** මහතාද ඒ සියලු අදහස් සමාලෝචනය කොට මහාවංසය දේශීය සභ්‍යත්වයේ සියලු පැතිකඩ අධ්‍යයනය කිරීමට වැදගත් වන මූලාශ්‍රය බව සනාථ කොට ඇත.

මේ අනුව රටේ සභ්‍යත්වයේ සියලු පැතිකඩ සම්පූර්ණ ලෙස මහාවංසයේ ලියා තබා ඇත්නම් වෙනත් ඉතිහාස පොත් ලිවීමක් අවශ්‍ය වන්නේ නැතැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන. මහාවංසය යනු ඉතිහාස පොතක් නොව එය මෙරට සභ්‍යත්වයේ සියලුම ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා යොදාගත හැකි මූලාශ්‍රයක් පමණක් බව අප දැන සිටීම අතිශය වැදගත් වේ.

## *දැනට ලියා පළකොට ඇති මහවංසයේ වෙළුම් පිළිබඳ තොරතුරු.*

ක්‍රි.ව. 05 වෙනි සියවසේදී ප්‍රචලිතව පැවති පාලි භාෂාවෙන් ලිවීම ආරම්භ කළ මහාවංසය අඛණ්ඩව ලිවීම වර්තමානය දක්වා ම සිදු කිරීමට හැකිවීම මෙන්ම එය කාටත් කියවාගත හැකි පරිදි සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කිරීමටද හැකිවීම ජාතියක් වශයෙන් අපට ආඩම්බර විය හැකි කරුණකි. වර්තමානයේ අප කරන්නේ සිංහල භාෂාවෙන් ලියා අනතුරුව පාලි සහ ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කිරීම යි.

මහාවංසය පළමු වෙනි සහ දෙවෙනි වෙළුම් පාලි භාෂාවෙන් ලියා ඉංග්‍රීසි සහ සිංහල භාෂාවලට පරිවර්තනය කොට ඇතත් 3, 4, 5 වෙළුම් සිංහල සහ පාලි භාෂාවලින් ලියා ඇති අතර තවම ඉංග්‍රීසියට පරිවර්තනය වී නැත එය නුදුරු අනාගතයේ සිදු කිරීමට දැනටමත් කටයුතු යොදා ඇත.

මහාවංසයේ එකම වෙළුමක් හෝ දෙමළ භාෂාවට පරිවර්තනය කොට නොමැති අතර නුදුරු අනාගයේදී සංස්කෘතික අමාත්‍යාංශය මගින් එය සිදු කෙරෙනු ඇත. දැනට දෙමළ භාෂාවට පරිවර්තනය කර ඇති මහාවංසයේ පළමු වෙනි වෙළුම සංස්කරණය කොට ළඟදීම ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කෙරෙමින් පවතී.

අඛණ්ඩව ලියැවෙන මහාවංසය 1978 දක්වා ලියා ප්‍රකාශයට පත් කොට ඇත. එය වෙළුම් පහකින් යුක්ත වේ.

### *මහාවංසයේ පළමුවෙනි වෙළුම*

ජාතියේ ඉතිහාසයේ ආරම්භයේ සිට ක්‍රි.ව. 301 දක්වා එනම් මහසෙන් රජුගේ රාජ්‍ය සමයේ අවසානය දක්වා වූ කාලය අලළා මෙම වෙළුම පාලි පද්‍යයෙන් ලියා ඇත. පසු කලෙක මෙම වෙළුමට ටීකාවක් සපයා ඇති අතර එය ප්‍රකාශයට පත්කළ කාලවකවානුව නිශ්චිත නැති නමුත් 08 වෙනි 09 වෙනි සියවස් තරම් කාලයේදී ලියා ඇති බව 1935දී එය සංස්කරණය කොට රෝමන් අකුරෙන් ප්‍රකාශයට පත්කරවූ මහාචාර්ය ජී.පී. මලලසේකරගේ මතය මෙන්ම සාමාන්‍ය පොදු පිළිගැනීම වේ. මහාවංසයේ පළමුවෙනි වෙළුමේ කතුවරයා මහාවිහාරවාසී මහානාම හිමියන් බව හෙළිකර ඇත්තේ මෙම ටීකාව මගින් වන අතර උන්වහන්සේගේ කෘතියේ අඩංගු වී නැති බොහෝ තොරතුරු මෙම ටීකාවේ ඇතුළත් වේ. මහාවංස පළමුවෙනි වෙළුමේ ඇති බොහෝ ව්‍යක්ත පාලි යෙදුම් එමගින් පැහැදිලි කර ඇත.

### *මහාවංසයේ දෙවෙනි වෙළුම*

ක්‍රි.ව. 301 සිට ක්‍රි.ව. 1815 දක්වා එනම් සිංහලේ අන්තිම රජතුමා වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බ්‍රිතාන්‍යයන් අතට පත්වීම දක්වා වූ කාලය අළලා ලියා ඇති මෙම වෙළුම 37 වෙනි පරිච්ඡේදයේ 51 වෙනි ගාථාවේ සිට 101 වෙනි පරිච්ඡේදය දක්වා පරිච්ඡේද 64කින් යුක්ත වේ. මෙම වෙළුම කොටස් තුනකින් සමන්විත වන අතර ඒවා පහත දක්වෙන පරිදි බෙදා දක්වා ඇත.

1. ක්‍රි. ව. 302 කිත්සිරිමෙවන් රජුගෙන් ආරම්භව මහා පරාක්‍රමබාහු රජුගේ පාලන සමය අවසාන වූ 1186 දක්වා වසර 884ක කාලය 79 වෙනි පරිච්ඡේදය තෙක් පරිච්ඡේද 42කින් යුක්තව සම්පාදනය කොට ඇත.

2. ක්‍රි. ව. 1186 සිට එනම් 90 වෙනි පරිච්ඡේදය තෙක් දෙවෙනි විජයබාහු රජුගේ පටන් ක්‍රි.ව. 1357 පස්වෙනි පරාක්‍රමබාහු රජු දක්වා වසර 171ක කාලය පරිච්ඡේද එකොළහකින් යුක්තව සම්පාදනය කොට ඇත.

මෙම වෙළුමෙහි ඉහතකී කොටස් රචනා කළ භික්ෂූන්වහන්සේ පිළිබඳ විවිධ උගතුන් අතර නිශ්චිත එකඟතාවක් නැත.

3. ක්‍රි. ව. 1357 සිට එනම් තුන්වෙනි විජයබාහු රජුගේ පටන් ක්‍රි.ව. 1815 ශ්‍රී වික්‍රමරාජසිංහ රජු ඉංග්‍රීසීන් අතට පත්වීම දක්වා ගැනෙන වසර 441ක කාලය 100 වෙනි පරිච්ඡේදය තෙක් පරිච්ඡේද දහයකින් සහ ඊළඟ පරිච්ඡේදය ගාථා 29කින් යුක්තව සම්පාදනය කර ඇත.

මහාවංසයේ දෙවෙනි වෙළුමේ පළමුවෙනි කොටසේ කතුවරයා දඹදෙණි අවධියේ විසූ ධර්මකීර්ති නමැති හිමිනමක් බව කියන මතය ප්‍රතික්ෂේප කරන පොල්වත්තේ බුද්ධදත්ත හිමි සහ මහාචාර්ය මංගල ඉලංගසිංහ සමග යගිරල පඤ්ඤානන්ද හිමියෝද එකඟ වෙති. එහෙත් එකී විද්වතුන් දෙදෙනා විසින් පිළිගනු ලැබ ඇති පරිදි එම වෙළුම සම්පාදනය කරනු ලැබුවේ රාජගුරු ධර්මකීර්ති නමැති හිමිනමක් විසින් බව කියන මතයද උන්වහන්සේ ප්‍රතික්ෂේප කරති.

***මහාවංසයේ තෙවෙනි වෙළුම***

ක්‍රි. ව. 1815 දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසින්ගේ අත්අඩංගුවට පත් වූ අවස්ථාවේ සිට ක්‍රි. ව. 1936 දක්වා වූ කාලය අළලා ලියා ඇති 'මහාවංසො' (තතිය භාගො) නමින් යගිරල පඤ්ඤානන්දාභිධාන නායකථෙර විසින් සම්පාදිත මෙම වෙළුම 101 වෙනි පරිච්ඡේදයේ 30 වෙනි ගාථාවේ සිට 114 දක්වා පරිච්ඡේද දොළහකින් යුක්ත වේ.

මහාවංසයේ දෙවෙනි වෙළුම 1815 වසර දක්වා තොරතුරු ඇතුළත් කොට ලියා ඇති නමුත් එම අවදියේ අපරදිග ජාතීන්ගේ පැමිණීමත් සමග සිදු වූ වැදගත් දේශපාලන සහ ආගමික සිද්ධි සමහරක් පිළිබඳ තොරතුරු ඊට ඇතුළත් වී නොමැති බැවින් ඒවාට අදාළ මූලාශ්‍රය ලේඛන තෙවෙනි වෙළුමේ ප්‍රස්තාවනාවේ x-xxxiv පිටුවල ඇතුළත් කර ඇත.

***මහාවංසයේ සිව්වෙනි වෙළුම***

ක්‍රි. ව. 1936 සිට ක්‍රි. ව. 1956 දක්වා කාලය අලළා ලියා ඇති මෙම වෙළුම ආචාර්ය නන්දදේව විජේසේකර වියතාගේ ප්‍රධානත්වයෙන් සම්පාදක මණ්ඩලයක් විසින් 115 වෙනි පරිච්ඡේදයේ සිට 124 වෙනි පරිච්ඡේදය දක්වා පරිච්ඡේද 10 කින් යුක්තව සම්පාදනය කර ඇත. එතෙක් විශේෂයෙන් භික්ෂූන් වහන්සේ විසින් රජයේ අනුග්‍රහය ලබමින් එහෙත් ස්වේච්ඡාවෙන් සම්පදානය කරන ලද මහාවංස සම්පාදන ක්‍රමයේ පුළුල් වෙනසක් ඇති කළ මෙම නව වෙළුම සෘජු ලෙස රජයේ අනුග්‍රහයෙන් රජය විසින් පත්කරන ලද මණ්ඩලයක් විසින් සම්පාදනය කරන ලද මුල්ම වෙළුම වේ.

රටේ රාජ්‍ය නායකයා කේන්ද්‍රකොට ගෙන පරිච්ඡේද බෙදමින් මහාවංසය ලිවීමේ සම්ප්‍රදාය අනුගමනය නොකොට විවිධ විෂයයන් යටතේ ශාස්ත්‍රීය ලිපි පෙළක ස්වරූපයෙන් ලියා තිබීමද මෙම වෙළුම 'මහාවංසය' නූතන යුගය - ප්‍රථම භාගය' 1935 -1956 දක්වා ලෙස හඳුන්වා තිබීමද බරපතළ දෝෂ වේ. එය නූතන යුගය හෝ ප්‍රථම භාගය ලෙස හැඳින්වීමට කිසිදු සාධාරණ හේතුවක් නැති අතර එය පාඨකයා නොමග යවනසුලු හැඳින්වීමක් වේ. එබැවින් මෙම වෙළුම නියම වශයෙන්

මහාවංසයේ සිව්වෙනි වෙළුම ලෙස පිළිගත හැකිවන පරිදි මහාවංසය ලිවීමේ සම්ප්‍රදාය අනුගමනය කර පරිච්ඡේද බෙදා වෙන්කරමින්ද නූතන යුගය ප්‍රථම භාගය වැනි අනුචිත යෙදුම් ඉවත්කරමින්ද පුළුල් සංස්කරණයක් සිදු කළ යුතුව ඇත. එම සංස්කරණ කර්තව්‍ය 2020 වසරේ දී ආරම්භ කොට ඇත.

***මහාවංසයේ පස්වෙනි වෙළුම***

මෙම වෙළුම 1956 සිට 1978 කාලය අලළා ආචාර්ය පූජ්‍ය බෙල්ලන ශ්‍රී ඤාණවිමල මහනායකඩ හිමියන්ගේ සභාපතිත්වයෙන් යුත් විද්වත් මණ්ඩලයක් මගින් සම්පාදානය කර ඇත. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් රජයේ අනුග්‍රහයෙන් ලියා පළකොට ඇති මෙය 125- 129 දක්වා පරිච්ඡේද හතරකින් යුක්ත වේ.

***මහාවංසයේ හයවෙනි වෙළුම***

මෙම වෙළුම 1978 - 2010 දක්වා කාල පරිච්ඡේදය අලළා සම්පාදනය කර ඇත. මහාවංසය ලිවීම ඊටම ආවේණික වූ සම්ප්‍රදායකට අනුව සිදු කිරීම විශේෂ ලකෂණයකි. මහාවංසයේ කිසියම් වෙළුමක් සම්පාදනය කිරීමේදී ඊට අයත්වන කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය නායකත්වය දැරූ රජු, ආණ්ඩුකාරවරයා, අගමැතිවරයා හෝ ජනාධිපතිවරයා වැනි කවුරුන් හෝ කේන්ද්‍ර කොටගෙන අදාළ කාල පරිච්ඡේදයතුළ දේශීය සභ්‍යත්වය වර්ධනය වූ ආකාරය පැහැදිලි කරමින් පරිච්ඡේද සැලසුම් කිරීම එම විශේෂිත සම්ප්‍රදාය වේ. ඒ අනුව ලිවීමට නියමිත වූ 1978 -2010 දක්වා කාලයට අදාළ මහාවංසය හයවෙනි වෙළුම 1978දී බලයට පත්වූ මුල්ම විධායක ජනාධිපතිවරයාද අනතුරුව පිළිවෙළින් 2010 දක්වා රාජ්‍ය නායකත්වය දැරූ ජනාධිපතිවරුන්ද කේන්ද්‍රකොට ගෙන පරිච්ඡේද සැලසුම් කර ඇත.

1956 - 1978 තෙක් කාලය අලළා ලියන ලද මහාවංසයේ පස්වෙනි වෙළුමේ අන්තිම පරිච්ඡේදය වූ 129 වැන්න ජේ. ආර් ජයවර්ධන අගමැතිවරයා රාජ්‍ය නායක ධූරය දැරූ 1977 ජුලි 23 වෙනි දින සිට 1978 පෙබරවාරි 04 වෙනි දින ඔහු ජනාධිපති ධූරයට පත් වූ අවස්ථාව තෙක් වූ කෙටි කාල පරිච්ඡේදය අලළා ලියා ඇත. ඔහු ඉදිරියටත් ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිවරයා ලෙස රාජ්‍ය නායකත්වය දැරීමට නියමිත වූ බැවින් ඔහුගේ පාලන සමය පිළිබඳ තවදුරටත් ලිවීමට ඉඩතබා 129 වෙනි පරිච්ඡේදය මහාවංසයේ කිසියම් පරිච්ඡේදයක් අවසන්කරනු ලබන සුපුරුදු ගාථාවෙන් අවසන් නොකර එය අසම්පූර්ණ ලෙස තබා ඇත. එහෙත් හවෙනි වෙළුම ආරම්භ වනුයේ අගමැති ධූරයට වඩා බෙහෙවින් වෙනස් විධායක ජානධිපති ධූරය දැරූ රාජ්‍ය නායකයන් මුල්කරගෙන වන බැවින්ද ජේ. ආර් ජයවර්ධන ජනාධිපතිවරයා එම ධූරයට පත්වූ 1978 පෙබරවාරි 04 වෙනි දිනට පසුව එම වර්ෂය තුළ සිදුවූ විස්තරාත්මකව ලිවිය යුතු ඇතැම් සිදුවීම් පිළිබඳව 129 වෙනි පරිච්ඡේදයේ ඉතා කෙටියෙන් සඳහන් කර ඇති බැවින්ද එමගින් 1978 පෙබරවාරි 04 වෙනි දින සිට එම වසර තුළ සිදුවූ විස්තරාත්මකව ඇතුළත් විය යුතු ඇතැම් වැදගත් තොරතුරු මගහැරී ඇති බැවින්ද 129 වෙනි පරිච්ඡේදය ඉදිරියට ගෙනයෑම අසීරු විය. එබැවින් ජේ. ආර් ජයවර්ධන ජනාධිපතිවරයාගේ පාලන සමය පිළිබඳ නව පරිච්ඡේදයක් ආරම්භ කිරීමට සම්පාදක මණ්ඩලය විසින්

තීරණය කරන ලදී. ඒ අනුව මහාවංසයේ හයවෙනි වෙළුම පහත දැක්වෙන පරිදි පරිච්ඡේද හතරකින් සමන්විත වේ.

- 130 වෙනි පරිච්ඡේදය - ජුනියස් රිචඩ් ජයවර්ධන ජනාධිපතිවරයාගේ පාලන සමය : 1978 පෙබරවාරි 04 වෙනි දින සිට 1989 ජනවාරි 02 වෙනි දින දක්වා.

- 131 වෙනි පරිච්ඡේදය - රණසිංහ ප්‍රේමදාස සහ ඩිංගිරිබංඩා විජේතුංග යන ජනාධිපතිවරුන්ගේ පාලන සමය :- 1989 ජනවාරි 02 වෙනි දින සිට 1994 නොවැම්බර් 12 වෙනි දින දක්වා.

- 132 වෙනි පරිච්ඡේදය - චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග ජනාධිපතිවරියගේ පාලන සමය :- 1994 නොවැම්බර් 12 වෙනි දින සිට 2005 නොවැම්බර් 19 වෙනි දින දක්වා.

- 133 වෙනි පරිච්ඡේදය - මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පළමු වෙනි පාලන සමය : 2005 නොවැම්බර් 19 වෙනි දින සිට 2010 නොවැම්බර් 17 වෙනි දින දක්වා.

ඉහත කී වෙළුම් හයට අමතරව මහාවංසයට අදාළව ප්‍රකාශයට පත්කර ඇති ග්‍රන්ථ සංස්කරණ සහ තවත් වැදගත් කෘති කිහිපයක් ඇත.

<u>2020 මහාවංසය සම්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාම</u>

ශ්‍රී ලංකාවේ ජාතික වංස කතාව වන මහාවංසය අඛණ්ඩව සම්පාදනය කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. ඒ අනුව 04, 05 සහ 06 වෙනි වෙළුම් සංස්කෘතික අමාත්‍යාංශය යටතේ සම්පාදනය කර ඇත. මහාවංස සම්පාදන කටයුතු අඛණ්ඩව සිදු කිරීම සඳහා 2019 ජුලි මස 03 වෙනි දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව

- මහාවංසය 04 වෙළුම සංස්කරණය කිරීම
- 03 වෙළුම සිට 06 වෙළුම් දක්වා ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම
- මහාවංසය 01 සිට 06 වෙනි වෙළුම් දක්වා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම
- අදාළ කටයුතු 2020 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සැලසුම් කොට සම්පාදනය කරමින් පවතී

**සමස්ත සම්බන්ධීකරණය**

ගෞරව ශාස්ත්‍රවේදී ඉනේෂ් කැටිපේආරච්චි
මහාවංස සම්පාදන කාර්යාලයේ සම්බන්ධීකරණ,
පර්යේෂණ හා සංවර්ධන නිලධාරි
රාජ්‍ය සාහිත්‍ය උපදේශක සභාවේ - සමලේකම්
දු.ක. 0702448876